ශ්‍රී ලංකා පුවත්පත් පැමිණිලි කොමිසමේ රීති සහ පැමිණිලි කාර්ය පටිපාටිය

අ) පැමිණිලි කිරීම

1) ශ්‍රී ලංකාව තුළ, යම් පුවත්පතක, සඟරාවක, හෝ අන්තර්ජාලයේ මාර්ගගත පුවත් සංස්කරණයක, පළ කරන ලද පුවතකින්, ලිපියකින්, ඡායාරූපයකින් හෝ රූ සටහනකින් යම් පුද්ගලයකු පීඩාවට පත්ව ඇතැයි සාධාරණ ලෙස විශ්වාස කරන්නේ නම්, එවිට ඔහුට, ඇයට හෝ වෙනත් පුද්ගලයකුට/ පුද්ගලයින්ට ශ්‍රී ලංකා පුවත්පත් පැමිණිලි කොමිසමට පැමිණිලි කළ හැකිය. එවැනි පැමිණිලි පහත සඳහන් අවශ්‍යතා සපුරාලිය යුතු වේ.

අ) එම පැමිණිල්ල ශ්‍රී ලංකා පපුවත්පත් පැමිණිලි කොමිසමේ වෙබ් අඩවියේ දැක්වෙන ආකෘතියට අනුව සකස් කොට ඉදිරිපත් කළ යුතු වේ. එම ආකෘතිය www.pccsl.lk වෙතින් බාගත කර ගත හැකිය.

ඉ) එහි දී පවතින ගැටලුව ලිඛිතව, ලුහුඩින් විස්තර කොට පැමිණිලි කරන්නාගේ අත්සනින් යුතුව විධිමත්ව ඉදිරිපත් කළ යුතු වේ.

උ) එය ශ්‍රී ලංකා පුවත්පත් පැමිණිලි කොමිසම වෙත පුද්ගලිකව භාරදීමෙන්, ලියාපදිංචි තැපෑලෙන්, ෆැක්ස් හෝ ඊ-මේල්, හෝ වෙනත් අනෙකුත් ඉලෙක්ට්‍රොනික සන්නිවේදන මාර්ගයකින්, සන්නිවේදනය කළ හැකිය.

එ) එසේ ප්‍රසිද්ධයට පත් කළ අයිතමයක්/ ඔන්ලයින් වෙබ් අඩවියක වේ නම්, ඒවා පැරණි ඔන්ලයින් අඩවියක සොයා ගත හැකි නම් හෝ එම ඔන්ලයින් සංස්කරණයේ ලින්කුවක් (link) මගින් සොයා ගත හැකි නම් ඒවා බාගත කොට ඒවායේ මුද්‍රිත පිටපතක් ශ්‍රී ලංකා පුවත්පත් පැමිණිලි කොමිසම වෙත යොමු කළ යුතුය.

ඔ) ප්‍රසිද්ධියට පත් කිරීමෙන් යම් අයකු පීඩාවට පත් වූයේ යයි සළකන අයිතමය පැමිණිල්ලත් සමඟ අමුණා එවිය යුතුය. පැමිණිල්ල ඊ මේල් මගින් හෝ වෙනත් ඉලෙක්ට්‍රොනික මාධ්‍යයකින් එවන්නේ නම් ප්‍රසිද්ධියට පත් කළ අයිතමය ද ඒ සමඟ එවිය යුතුය.

ක) ප්‍රසිද්ධියට පත් කළ අයිතමයේ පිටපතක් පැමිණිලිකරුට සොයා ගැනීමට නොහැකි වූ අවස්ථාවක එකී ප්‍රසිද්ධියට පත් කළ අයිතමය සොයා ගැනීමට ශ්‍රී ලංකා පුවත්පත් පැමිණිලි කොමිසමේ ලේකම් කාර්යාලය සෑම වෑයමක්ම දරමින් පැමිණිලිකරුට සහය දක්විය යුතුය.

2) (අ) පැමිණිලිකරුට ශ්‍රී ලංකා පුවත්පත් පැමිණිලි කොමිසම වෙතින්

(i). සමථකරණය මගින් ආරවුලක් නිරවුල් කිරීමට

(ii). මැදිහත්කරණය මගින් ආරවුලක් නිරවුල් කිරීම හෝ

(iii). අදාල කාරණය පිළිබඳ සලකා බලා බේරුම්කරණය මගින් තීරණයක් ලබා දෙන ලෙස ඉල්ලා සිටිය හැකිවේ.

පැමිණිල්ලෙන් පසු කොමිසමේ ආරාවුල් නිරාකරණ මණ්ඩලය (මීන් අනතුරුව මණ්ඩලය යනුවෙන් හඳුන්වන) විසින් පහත අංක 7 අනුව ගන්නා ලද ක්‍රියාමාර්ග හේතුවෙන්, අදාළ පුවත්පතේ, සඟරාවේ, ඔන්ලයින් වෙබ් අඩවියේ කතුවරයා, පැමිණිල්ලට අදාළ කාරණය සම්බන්ධයෙන් නිවැරදි කිරීමක්, සමාව ඉල්ලීමක් හෝ මණ්ඩලයේ මතය අනුව යමින් පිළිතුරු දීමේ අයිතිය පිළිගෙන වැරදුනු තැන් නිවැරදි කිරීම කරන්නේ නම් දෙපාර්ශ්වය තවදුරටත් සමථයකට හෝ බේරුම් කිරීමටකට යොමු විය යුතු වේ.

(ආ) පැමිණිලි කරන්නා විසින් අදාළ කාරණය සම්බන්ධයෙන් ශ්‍රී ලංකා පුවත්පත් පැමිණිලි කොමිසමේ බේරුම්කරණය මගින් තීරණයක් ඉල්ලා සිටින අවස්ථාවක දී පැමිණිලිකරු ඉහත (1) හි දැක්වෙන අවශ්‍යතාවලට අමතරව පහත අවශ්‍යතා සපුරාලිය යුතුය.

(i). ද්‍රව්‍යමය සාධක සහිතව ගැටළුවට අදාළ තත්ත්වයන් පැහැදිලිව ඉදිරිපත් කළ යුතු වේ.

(ii). සාක්ෂි ප්‍රකාශයක් ඉදිරිපත් කළ යුතුය. සහ

(iii). පැමිණිලි කරන්නා විසින් අපේක්ෂා කරනු ලබන සහනය පැහැදිලිව දැක්විය යුතුය.

3. යම් අයිතමයක් පළ කර අවුරුද්දක් ඉක්ම ගොස් ඇති නම්, ඊට එරෙහි පැමිණිලි සම්බන්ධයෙන් ක්‍රියාත්මක වීමට ශ්‍රී ලංකා පුවත්පත පැමිණිලි කොමිසම බැඳී නැත.

බී. මණ්ඩලයේ කාර්යභාරය

4. නිසි පරිදි ලැබුනු පැමිණිල්ලක් මණ්ඩලය විසින් භාරගත යුතු වන්නේ පළ කළ අයිතමය මගින් ශ්‍රී ලංකා පුවත්පත් ආයතනය සහ ශ්‍රී ලංකා පුවත්පත් පැමිණිලි කොමිසම විසින් පිළිගත්, ශ්‍රී ලංකා කර්තෘ සංසද වෘත්තීය ප්‍රතිපත්ති

මාලාවට අදාළ ආචාර ධර්ම උල්ලංඝනය වේ යයි සිය අභිමතය අනුව පිළිගත හැකි විටක දී පමණි.

5. පළ කර ඇති අයිතමය මගින් ශ්‍රී ලංකා කර්තෘ සංසද වෘත්තීය ආචාර ධර්ම පද්ධතිය උල්ලංඝනය වී නැතැයි මණ්ඩලයේ සාමාජිකයින් අදහස් කරන විටක දී, මණ්ඩලය විසින් පැමිණිල්ල ප්‍රතික්ෂේප කොට එය සති දෙකක් තුළ දී පැමිණිලි කරුට ලිඛිතව දැනුම් දිය යුතුය. ප්‍රතික්ෂේප කිරීමේ දැන්වීම පැමිණිලිකරුට නොයවන අවස්ථාවක දී මණ්ඩලය විසින් පැමිණිල්ල පිළිගෙන ඇති බව සැලකිල්ලට ගත යුතුය. මෙහි දී පැමිණිල්ල භාර ගත් දිනය එය මණ්ඩලයට ලැබුනු දිනය ලෙස සැලකිය යුතු වේ.

6. පැමිණිල්ල පිළිගත් විටක දී, පැමිණිලිකරුට පීඩා ගෙන දුන් බවට කියන අයිතමයේ පිටපතක් සහිතව, එක් වැඩ කරන දිනක් ඇතුළත මණ්ඩලය අදාළ පුවත්පතේ, සඟරාවේ හෝ ඔන්ලයින් වෙබ් අඩවියේ කතුවරයා සමඟ ඊට අදාළ සන්නිවේදන කටයුතු කළ යුතු වේ. එසේ සන්නිවේදනය කරන ඇමතුමකින් මණ්ඩලය එකී කතුවරයාට පැමිණිල්ල සම්බන්ධයෙන් වැඩ කරන දින 5ක් ඇතුළත ක්‍රියාකාරීවීම හෝ පිළිතුරු දීම කළ යුතු බවට දැන්විය යුතු වේ.

7 පුවත්පතේ හෝ සඟරාවේ කතුවරයා සමඟ සන්නිවේදනයේ යෙදුණු දින සිට නියමිත දින ගණන තුළ දී ඔහු ප්‍රතිචාර නොදැක්වුව හොත් මණ්ඩලය, එකී පැමිණිල්ලට අදාළ ක්‍රියාමාර්ග ගන්නා ලෙස හෝ පිළිතුරු දෙන ලෙස ඍජුවම ප්‍රකාශකයාට දැන්විය යුතුය. කතුවරයා හෝ ඔවුන් වෙනුවෙන් පෙනී සිටින තැනැත්තා, පැමිණිල්ල උදෙසා පිළිතුරු දීමට කල් ඉල්ලා සිටින විටක දී තම අභිමතය පරිදි ඒ සඳහා කාලය දීර්ඝ කර දීමට මණ්ඩලයට හැකිය.

එසේ වූ කළ තවදුරටත්, පුවත්පතේ නිවැරදි කිරීමක් හා/හෝ පිළිතුරු දීමේ අයිතිය පිළිගෙන පළ කිරීමක් කළ හොත් එය, එම පුවත්පත, සඟරාව හෝ ඔන්ලයින් සංස්කරණය විසින් පිළිතුරු ලබා දීමට අවස්ථාව සලසා දීමක් ලෙස පිළිගැනේ.

8 කෙටි කාලයක් තුළ දී ඊට අදාළ පාර්ශවයන් සමථයක් කරා ගෙන ඒමට මණ්ඩලය සෑම උත්සාහයක්ම දරනු ඇත. එහෙත් එසේ කරනුයේ පැමිණිල්ල භාර ගෙන සති දෙකක් ඉක්ම නොගිය කාලයක් තුළ දීය.

සී. සමථ කිරීම

9 පැමිණිල්ල කරන විටෙක දී, පැමිණිල්ල සමඟ ශ්‍රී ලංකා පුවත්පත් පැමිණිලි කොමිසම වෙතින් අදාළ කාරණය පිළිබඳ සමථකරණය මගින් නිරාකරණය කරන ලෙස ඉල්ලීමක් කළ හොත්, එවිට මණ්ඩලය විසින් එම ඉල්ලීම සමථකරණය සඳහා ප්‍රධාන විධායක නිළධාරී (CEO) වෙත යොමු කරනු ඇත. පාර්ශවයන් සමථයකට එකඟ වූ පසු නිවැරදි කිරීමක් සහ/හෝ, කරුණු පැහැදිලි කිරීමක්/ සමාව ඉල්ලීමක් සහ/හෝ පිළිතුරු දීමේ අයිතිය ඊට ඇතුළත් විය හැකිය.

10 ප්‍රධාන විධායක නිලධාරීගේ අපක්ෂපාතීත්වය හෝ ස්වාධීනත්වය පිළිබඳව සාධාරණ සැකයක් පවතින හෝ මතුවීමට ඉඩ ඇති අවස්ථාවක දී, සමාදානය සඳහා වූ කාරණයත්, ඊට අදාළව මතු වී ඇති වාතාවරණයත් ප්‍රධාන විධායක නිළධාරී, ලිඛිතව, මණ්ඩලයට හෙළි කළ යුතු වේ. එවැනි අවස්ථාවක මන්ඩලය විසින් එම පැමිණිල්ල සමාදානය සඳහා මණ්ඩලයේ වෙනත් සාමාජිකයකු වෙත යොමු කළ යුතු වේ.

11. අදාළ කාරණය සමථකරණයෙන් විසඳා ගත නොහැකි වේ යයි යන මතය මණ්ඩලය විසින් දරණ අවස්ථාවක දී, ආරවුල විසඳා ගත හැකි වෙනත් මාර්ගයක් පිළිබඳව සලකා බලන ලෙස මණ්ඩලයට යෝජනා කළ හැකිය.

ඩී. මැදිහත්කරණය

12. පැමිණිලි කරන අවස්ථාවක දී, එම පැමිණිල්ල සමඟ, මැදිහත් කරණය යටතේ නිරාකරණය කර දෙන ලෙස ශ්‍රී ලංකා පුවත්පත් පැමිණිලි කොමිසමෙන් ඉල්ලීමක් කළ විටක දී, ඒ සඳහා මැදිහත්වන ලෙස, මණ්ඩලය විසින් එවැනි ඉල්ලීමක් ප්‍රධාන විධායක නිලධාරී වෙත හෝ මණ්ඩලයේ සාමාජිකයින් තිදෙනා වෙත යොමු කළ යුතුය.

13 (අ) මණ්ඩලයේ ප්‍රධාන විධායක නිලධාරී (CEO) හෝ වෙනත් සාමාජිකයාගේ අපක්ෂපාතී බව හෝ ස්වාධීන බව පිළිබඳව සාධාරණ සැකයක් මතු විය හැකි හෝ මතු වන්නාසේ පෙනෙන විටක දී, ප්‍රධාන විධායක නිලධාරී හෝ අදාළ මණ්ඩල සාමාජිකයා එම වාතාවරණය පිළිබඳව මණ්ඩලය වෙත ලිඛිත හෙළිදරව් කිරීමක් කළ යුතු අතර එහිදී මැදිහත්කරු ලෙස ක්‍රියා නොකළ යුතු වේ.

(ඉ) එවැනි ලිඛිත හෙළිදරව් කිරීමක්, ප්‍රධාන විධායක නිළධාරී (CEO) විසින් හෝ ඉහත සඳහන් කළ පරිදි මැදිහත්වීමට පත් කළ සාමාජිකයකු ඉල්ලා අස්වූ විටක

දී ඉල්ලා අස් වූ සාමාජිකයා වෙනුවට මණ්ඩලය විසින් වෙනත් සාමාජිකයකු පත් කළ යුතුය.

14. අදාළ කාරණය මැදිහත් වීමක් තුළින් විසඳිය නොහැකි බව පෙනී යන්නේ යයි ප්‍රධාන විධායක නිලධාරියා හෝ මණ්ඩලය අදහස් කරන විටක දී ආරාවුල විසඳීමේ වෙනත් මාර්ගයක් පිළිබඳව සළකා බලන ලෙස මණ්ඩලයට යෝජනා කළ හැකිය.

15. මණ්ඩලය විසින් මැදිහත්කරුවකු ලෙස කරන ක්‍රියාදාමය තීරණය කළ යුතුය. එසේ ආරවුලට මැදිහත්වීම මගින් කඩිනම් සහ ආර්ථික වශයෙන් ඵලදායී විසඳුම් ලබා ගැනීමට පහසුකම් සැළසිය යුතුය.

(අ) සෑම පාර්ශවයකටම හොඳින් ඇහුම්කන් දිය යුතු වේ. තම ගැටලුව ඉදිරිපත් කිරීමට ස්වභාවික යුක්තිය මත පිහිටා සමාන අවස්ථා සෑම පාර්ශවයකටම ලබා දිය යුතුය.

(ඉ) අදාළ ආරවුල ප්‍රධාන විධායක නිලධාරිට හෝ මණ්ඩලයේ සාමාජිකයින් තිදෙනා වෙත යොමු කොට සති දෙකක් ඇතුළත නිරවුල් කළ යුතුය. කෙසේවුව ද මෙම කාලය පාර්ශ්ව කරුවන්ගේ ඉල්ලීම මත දීර්ඝ කළ හැකිය.

16. මැදිහත්වීමේ ක්‍රියාවලිය

(අ) පාර්ශවයන් එකඟතාවකට එළැඹ නිරාකරණය වීමෙන්

(ඉ) ප්‍රධාන විධායක නිලධාරීගේ හෝ මණ්ඩලයේ පත් කළ සාමාජිකයින්ගේ නිර්දේශය මත, අදාළ පරිදි ඉදිරි ක්‍රියාමාර්ග ඔස්සේ ආරවුලට විසඳුමක් ලබා දීමට නොහැකි බව පෙනී යන බව මණ්ඩලය විසින් නිකුත් කරන ප්‍රකාශයකින්

(ජ) කිනම් හෝ පාර්ශවයක් මැදිහත්වීමේ ක්‍රියාදාමය නතර කරන ලෙස කරන ලිඛිත ඉල්ලීමකින් අවසන් කළ යුතුය.

ඉහත (ඉ) හෝ (ජ) හි දී ඇති තත්ත්වයන් හේතු කොට ගෙන මැදිහත්වීමේ ක්‍රියාදාමය නිමා වන විටක දී, මණ්ඩලය විසින් එම කාරණය, පහත එ කොටසේ සඳහන්ව ඇති, මණ්ඩලය විසින් කරන බේරුම් කරන ක්‍රියාවලියකට යොමු කළ යුතු වේ.

කෙසේ වුවද මැදිහත් වීමේ ක්‍රියා දාමයේ කටයුතු කළ සාමාජිකයෙකු බේරුම්කාර විනිශ්චය සභාවට පත් නොකළ යුතුය.

කෙසේ වුවද සිය කැමැත්තෙන් තම පැමිණිල්ල ඉල්ලා අස්කර ගත් පැමිණිලිකරුවකුට හෝ පැමිණිලිකාරියකට බේරුම්කාර ක්‍රියාවලියකට අනුගත වීමේ අවස්ථාව නොලැබේ.

එ. බේරුම් කිරීම

17. ශ්‍රී ලංකාව තුළ මුද්‍රිතව පළ කරන ලද යම් ප්‍රකාශයක් සම්බන්ධයෙන් ශ්‍රී ලංකා පුවත්පත් පැමිණිලි කොමිසමේ හි කිනම් හෝ සාමාජිකයකු සමඟ ආරවුලක් පැන නැගුනු පැමිණිලිකරුවකු විසින් එම ආරවුල බේරුම් කර දෙන ලෙස ඉල්ලා ශ්‍රී ලංකා පුවත්පත් පැමිණිලි කොමිසම වෙත ඉල්ලීමක් කළ අවස්ථාවක දී හෝ ඉහත 11 හෝ 16 වගන්ති අනුව මණ්ඩලය විසින් බේරුම්කරණය සඳහා යොමු කිරීමට පැමිණිලිකරු එකඟ වන විටක දී, ඒ හා එක්ව ශ්‍රී ලංකා පුවත්පත් පැමිණිලි කොමිසමට ට සම්බන්ධ විධිවිධාන සංග්‍රහයේ 12වැනි වගන්තියට අදාළව පැමිණිලි කොමිසමේ හි සාමාජිකයාගේ කැමැත්ත ද සැලකිල්ලට ගෙන කොමිසමේ සාමාජිකයා හා එකී පැමිණිලිකරු අතර පැන නැගුණ ආරවුල, බේරුම්කරණය මඟින් විසඳීමට 1995 අංක 11 දරණ බේරුම්කරණ පනත අනුව බේරුම්කාර එකඟතාවක් සඳහා යොමු කළ යුතු වේ.

18 පැමිණිලිකරු සිය පැමිණිල්ල සමඟ අදාළ ගැටලුව බේරුම්කරණය මඟින් විසඳා දෙන ලෙස කරන ඉල්ලීමක දී ඉහත 16 හෝ 11 වගන්ති ප්‍රකාරව මණ්ඩලය විසින් එම කාරණය තවදුරටත් බේරුම්කරණය සඳහා යොමු කරන විටක දී මණ්ඩලය විසින් තම සාමාජිකයන්ගෙන් සැදුම්ලත් ත්‍රි පුද්ගල විනිසුරු මඩුල්ලක් ඒ සඳහා පත් කළ යුතුය. එම විනිසුරු මඬුල්ල අදාළ ආරවුල විසඳීමේ බේරුම්කරුවන් ලෙස ක්‍රියා කළ යුතු වේ.

19 ආරවුලට අදාළ පාර්ශව, මණ්ඩලය විසින් පත් කරන ලද විනිසුරු මඩුල්ලේ එක් සාමාජිකයකු හෝ ඊට වැඩි සංඛ්‍යාවක් ඊට ඇතුළත් වීම සම්බන්ධයෙන් විරෝධතාව පළ කරන්නේ නම්, මණ්ඩලය විසින් ඒ වෙනුවට තවත් සාමාජිකයකු හෝ සාමාජිකයන් පත් කළ යුතු වේ.

20 (අ) සාමාජිකයින් තිදෙනෙකුගෙන් සමන්විත විනිසුරු මඩුල්ල බේරුම්කරණය කරන විට දී

i. ඕනෑම විනිශ්චයක දී සණ පූර්ණය 2 හෝ ඊට වැඩි විය යුතුය.

ii. මණ්ඩලය නිතරම පුවත්පත්වලට සම්බන්ධ නොවූ සාමාජිකයන්ගේ බහුතරය පවත්වා ගත යුතු වේ. එසේම

iii. බහුතර මතය පවත්වා ගැනීමේ දී, බේරුම්කරුවන් 2කගේ ගණපූර්ණයෙන් යුතුව කරුණ පිළිබඳව තීරණ ගන්නා විට දී, ඒකමතික බව බහුතර මතය ලෙස සැලකේ.

(ඉ) පාර්ශවකරුවන්ගේ කැමැත්ත ඇතිව ඕනෑම කාරණයක් සම්පූර්ණ විනිශ්චය සභාවේ සැළකිල්ලට යොමු කළ යුතු බව, සිය අභිමතය පරිදි තීරණය කිරීමට සාමාජිකයින් තිදෙනෙක්ගෙන් සමන්විත විනිසුරු මඬුල්ලට හැකි වේ. එවැනි අවස්ථාවක විනිශ්චය සභාවේ ගණපූර්ණයේ සංයුතිය සාමාජිකයින් දෙදෙනෙකුට වඩා අඩු විය හැකිය.

21. බේරුම් කිරීමට ඇති කාරණය සම්බන්ධයෙන් තම අපක්ෂපාතීභාවය හෝ ස්වාධීනත්වය සමබන්ධයෙන් මණ්ඩලයේ යම් කිසි සාමාජිකයකුට සාධාරණ සැකයක් මතු වන අවස්ථාවක දී, එවැනි සාමාජිකයකු එම වාතාවරණය පිළිබඳව මණ්ඩලයට ලිඛිතව හෙළිදරව් කළ යුතු අතර එම කාරණය බේරුම් කිරීමේ කටයුතු නොකළ යුතුය.

බේරුම් කිරීමට ඇති කාරණය සම්බන්ධයෙන් මණ්ඩලය විසින් පත් කළ යම් සාමාජිකයකු ලිඛිත හෙළිදරව් කිරීමක් මණ්ඩලය වෙත කරන විටක දී ඉහත (අ) හි සඳහන් කොන්දේසිවලට යටත්ව ඔහුගේ හෝ ඇයගේ ස්ථානයට මණ්ඩලය විසින් වෙනත් සාමාජිකයකු පත් කළ යුතුය.

22. ආරවුලට කඩිනමින් සහ ආර්ථික වශයෙන් ඵලදායී විසඳුමක් ලබා ගැනීමට පහසුකම් සැලසීම උදෙසා ගත යුතු බේරුම්කාර ක්‍රියාමාර්ගය මණ්ඩලය විසින් තීරණය කළ යුතුය.

(අ) සෑම පාර්ශවයකටම හොඳින් ඇහුම්කන් දිය යුතු අතර, ස්වාභාවික යුක්තියේ මූලධර්මවලට අනුව තම ගැටලුව ඉදිරිපත් කිරීමට සමාන අවස්ථා දිය යුතුය.

(ඉ) බේරුම්කරුගේ ඉල්ලීම පරිදි, එහි දී තමන් සනාථ කිරීමට බලාපොරොත්තු වන විශේෂිත කාරණා සම්බන්ධයෙන්, තම විශ්වාසය රඳවා ගෙන තිබෙන දේ සනාථ කිරීමට සාක්ෂි ඉදිරිපත් කළ යුතුය/ සඳහන් කළ යුතුය.

(ජ) ඉදිරිපත් වී ඇති කුමන හෝ ප්‍රකාශයක් හෝ ප්‍රකාශන සම්බන්ධයෙන්, සවිස්තරාත්මකව කරුණු ඉදිරිපත් කරන ලෙසට, ආරවුලට අදාළ පාර්ශව වෙතින් මණ්ඩලය විසින් ඉල්ලා සිටිය යුතුය. එවැනි ඉල්ලීමකට අවනත විමට පැමිණිලිකරු අසමත් වුවහොත් තම අභිමතය පරිදි ගැටලුව විසඳීම අවසන් කර දැමීමට බේරුම්කරුට හැකිය. එවැනි ඉල්ලීමක අදාළ කතුවරයා හෝ ප්‍රකාශකයා

අවනත නොවුව හොත් බේරුම්කරණ ක්‍රියාවලිය දිගටම පවත්වාගෙන යාම නවතාලීමට එය හේතුවක් නොවන්නේය.

(එ) යම් පාර්ශවයක් මෙම නඩු විමසීමකට පෙනී නොසිටින්නේ නම් හෝ නියෝගයකට අවනත නොවන්නේ නම් හෝ එවැනි අවනතවීමකට හෝ පෙනී නොසිටීමට පිළිගත හැකි හේතු නොපෙන්වන විටක දී බේරුම්කරුට අදාළ ගැටලුව විසඳීමේ ක්‍රියාවලිය පවත්වාගෙන යාම නැවැත්වීමට එය හේතුවක් නොවන්නේය. තීන්දුවක් දීමටත් එය බාධාවක් නොවිය යුතුය.

23. බේරුම්කරුවා පහත ආකාරයෙන් බේරුම්කාර තීන්දුව දිය යුතු වේ.

(අ) බේරුම්කාර ක්‍රියාමාර්ගය යටතේ බේරුම්කරුවාට සහනදායී තීන්දුවක් දීමට ඇති බලය, පිළිතුරු දීමේ අයිතිය සහ/හෝ, නිවැරදි කිරීම, සමාව ඉල්ලීම, කරුණු දැක්වීම, අදාළ ප්‍රකාශයේම කතුවරයාට හෝ ප්‍රකාශකයාට පළ කරන ලෙස නියෝග කිරීමකට පමණක් සීමා විය යුතු වේ.

එසේ නැතහොත් වෙනත් සහනයක් දීමේ බලය පාර්ශවකරුවන් විසින් ලිඛිත ප්‍රකාශනයකින් ප්‍රදානය කළ යුතුය. එවැනි අවස්ථාවක කුමන හෝ තත්ත්වයක් යටතේ පළ කළ යුත්ත කිනම් දිනයක, කිනම් අංකය ඇති පිටුවක, හෝ නිශ්චිත පිටුවක කුමන ස්ථානයක, ඉහත කී ප්‍රකාශනයේ පළ කළ යුත්තේ ද යන්න තීරණය කළ හැකිය. බේරුම්කාර තීන්දුව ප්‍රකාශ කිරීමේ දී ඔන් ලයින්/ (අන්තර්ජාල) පුවත් සංස්කරණයට ද මෙය අදාලය.

(ඉ) ගැටලුවට ඉදිරිපත් වූ සියලුම කරුණු ඉතා නිවැරදිව සැලකිල්ලට ගෙන ඒවා ඇගයුම් කොට බේරුම්කරන්නා විසින් බේරුම්කාර තීන්දුව ප්‍රදානය කළ යුතු වේ.

(එ) අදාළ කරුණ බේරුම්කරණයට යොමු කිරීමෙන් එක් මාසයක් ඉක්ම නොගිය තැන/ ඉක්ම යාමට මත්තෙන් බේරුම්කාර තීන්දුව දිය යුතුවේ.

(ඔ) පාර්ශවය අතර ආරවුලට අදාළ එහි කොටසක් වූ ගැටලුවක් හෝ අමතර ගැටලුවක් වේ නම්, පාර්ශවකරුවකුගේ ඉල්ලීම මත ඊට අදාළ තීරණ වෙනම රැගෙන වෙනම තීන්දුවක් ප්‍රකාශයට පත් කළ යුතු වේ. අනෙක් පාර්ශවයක් එවැන්නකට විරෝධතාව පළ කරන විට දී, බේරුම්කරුවාට වෙනම වූ අමතර තීන්දුවක් දිය හැක්කේ අමතර වශයෙන් ඇති හේතු සළකා බැලීමෙන් අනතුරුවය. එසේ කළ හැකි වන්නේ,

(ක) පාර්ශවයක් විසින් අසම්පූර්ණ ලෙස තමන්ගේ හිමිකම පිළිබඳ කරුණු ඇතුළත් කොට ඇති අවස්ථාවක, එසේ ඇතුළත් කරනු ලැබූ කොටස වෙනුවෙන් බේරුම්කරුවාට වෙනම තීන්දුවක් දිය හැකිය.

(ග) සමථයක් ඇති කර ගත් විටක දී, එම පාර්ශවයන්ගේ ඉල්ලීම මත මණ්ඩලයට එම සමථය තීන්දුවක් ලෙස තහවුරු කොට ප්‍රකාශයට පත් කළ හැකිය.

(ට) තීන්දුව පිළිබඳ නිවැරදි කිරීමක්, වෙනස් කිරීමක් හෝ අර්ථනිරූපණයක් කළ යුතු බව නිර්ණය කරන විටක දී, එය ක්‍රියාත්මක කළ හැක්කේ බේරුම්කරණයට අදාළ පාර්ශවයන්ට තම මතයන් ප්‍රකාශ කිරීමට අවස්ථාවක් දීමෙන් අනතුරුව, පහත සඳහන් තත්ත්වයන් යටතේය.

i. තීන්දුවෙහි ඇති මුද්‍රණ දෝෂයක් හෝ වැරදියට ගණනය කිරීමක් බේරුම්කරුට නිවැරදි කළ හැකිය.

ii. තීන්දුවේ දී තීරණයක් ගත යුතුව තිබුණ ප්‍රශ්නයක් ගැන ඒ වන විට තීන්දු කොට නැත්නම් ඒ පිළිබඳව බේරුම්කරුවාට තීරණයක් ගත හැකි වේ. එවැනි අවස්ථාවක දී යම් පාර්ශවයකට තීන්දුව දී දින තිහක් (30) ඇතුළත ඒ පිළිබඳ ඉල්ලීමක් කළ හැකි වේ.

iii. බේරුම් කිරීමට අදාළව තීන්දුව දී දින 30ක් ඇතුළත පාර්ශවකරුවකු විසින් කරන ලිඛිත ඉල්ලීමක දී බේරුම්කරුට තීන්දුව පිළිබඳ අර්ථනිරූපණයක් සැපයිය හැකිය.

25. ශ්‍රී ලංකා පුවත්පත් පැමිණිලි කොමිසමෙ හි මණ්ඩලය විසින් දෙනු ලබන තීන්දු 1995 අංක 11 දරණ බේරුම්කරණ පනත යටතේ ඇති බේරුම්කාර විනිශ්චය සභාවකින් දෙන තීන්දු හා සමාන වේ. එම නිසා මණ්ඩලයෙන් දෙන එවැනි තීන්දුවක් 1995 අංක 11 දරණ බේරුම්කරණ පනතේ වගන්ති ප්‍රකාරව, එකී තීන්දුව දී දින 14ක පටන් වසරක් ඇතුළත මහාධිකරණය වෙත ඉදිරිපත් කරන ඉල්ලීමක් මගින් බලාත්මක කර ගත හැකිය.

25 බේරුම්කරණය සඳහා අදාළ ගාස්තු හා වියදම් පිළිබඳව මණ්ඩලය තීරණය කළ යුතුය. එවැනි ගාස්තු හා වියදම් කාගෙන් කෙසේ අය කර ගන්නේ ද යන්නත් මණ්ඩලය විස්තර කොට කියා සිටිය යුතුය.

26 බේරුම්කාර නඩු කටයුතු හමාර වූ විට බේරුම්කරුවා විසින් තීන්දුවේ පිටපතකුත් සියලුම පරීක්ෂණ වාර්තාත් ශ්‍රී ලංකා පුවත්ප් පැමිණිලි කොමිසම වෙත ඉදිරිපත් කළ යුතුය.

F. වාර්තා පවත්වා ගැනීම

27 දුරකථනමය සහ වාචික පැමිණිලි ඇතුළුව සියළුම පැමිණිලි, සමථකරණය කිරීම් පිළිබඳ තීරණ, මැදිහත්වීම්, බේරුම් කිරීම් පිළිබඳ පරීක්ෂණ පිළිබඳ සියලුම වාර්තා ප්‍රධාන විධායක නිලධාරී විසින් පවත්වා ගෙන යා යුතු වේ. ඒවා ශ්‍රී ලංකා පුවත්පත් පැමිණිලි කොමිසම වෙත සපයා දිය යුතුය. කරන ලද පැමිණිලි, විනිශ්චය කොට දෙන ලද තීරණ, විනිශ්චය කිරීමට නියමිත පැමිණිලි පිළිබඳ ව ශ්‍රී ලංකා පුවත්පත් පැමිණිලි කොමිසම විසින් ප්‍රකාශයට පත් කරනු ලබන වාර්ෂික වාර්තාවේ පළ කිරීමෙන් මහජනයාට දැනුවත් විය හැකිය.

G. දැන්වීම්

28 අවශ්‍ය විටක දී ශ්‍රී ලංකා පුවත්පත් පැමිණිලි කොමිසම අමතා ඕනෑම ලේඛනයක්, කුරියර් මගින් හෝ ලියාපදිංචි තැපෑලෙන් එවූ අවස්ථාවක පැමිණිලි කොමිසම වෙත එය භාර දෙනු ලැබූ දිනය ලෙස සැලකිය යුතු වේ.

29 මණ්ඩලය වෙත ලැබෙන සියලුම පැමිණිලි සම්බන්ධයෙන් සහ මණ්ඩලය ගනු ලබන තීරණ සම්බන්ධයෙන් ප්‍රකාශ නිකුත් කළ යුත්තේ ප්‍රධාන විධායක නිලධාරීවරයා ය. අවශ්‍ය අවස්ථාවලදී ඔහුට ඒ සඳහා මණ්ඩලයේ සභාපතිවරයාගෙන් උපදෙස් ලබා ගත හැකිය.

පුවත්පත්වලට හෝ ඉලෙක්ට්‍රොනික මාධ්‍යයන්ට මහජනයාගෙන් දැන ගැනීමට, පැවැත්වෙන විමර්ශනයක් පිළිබඳ තතු, මණ්ඩලය විසින් දෙනු ලබන තීන්දුවක් පිළිබඳ අර්ථකථනය කිරීම ප්‍රධාන විධායක නිලධාරී විසින් මණ්ඩලයේ සභාපතිවරයාගේ උපදෙස් ගැනීමකින් තොරව කළ යුතු නොවේ.

30 ශ්‍රී ලංකා පුවත්පත් පැමිණිලි කොමිසම ට අදාළ කරණා සම්බන්ධයෙන් සියලු පුවත්පත් ප්‍රකාශ මෙන්ම වාචික ප්‍රකාශ නිකුත් කරද්දී, ප්‍රධාන විධායක නිලධාරී විසින් මාධ්‍යයන්ට හෝ මහජනයා දැනුවත් කරන අවස්ථාවල ඒ සඳහා ශ්‍රී ලංකා පුවත්පත් පැමිණිලි කොමිසමේ සභාපතිවරයාගේ පූර්ව අනුමැතිය ලබා ගත යුතුය. ඒ හා බැඳුනු යම් පැමිණිලි ස්වරූපයේ ගැටලුවක් පැන නැඟුණු විට ඒ සඳහා 29 ඡේදයේ කරුණු අදාළ වේ.

රීති පිළිබඳව නැවත සළකා බැලීම

31 මෙම කාර්ය පටිපාටිය වාර්ෂිකව හෝ අවශ්‍යතාවක් පැන නැගුණු විට නැවත සමාලෝචනය කළ යුතු වේ. එවැනි අවස්ථාවක එම යෝජනා ප්‍රධාන විධායක නිලධාරී විසින්, මණ්ඩලය හා ශ්‍රී ලංකා පුවත්පත් පැමිණිලි කොමිසමේ හි අධ්‍යක්ෂ මණ්ඩලය වෙත ඉදිරිපත් කොට, ඒවා අනුමත කර ගැනීමත්, ක්‍රියාත්මක කිරීමත් කළ යුතුය.

2019/3/19